සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාතර්මේන්තුව

**Sabaragamuwa Provincial Department of Education**

சபரகமுவ மாகாணக் கல்வி திணைக்களம்

# අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය 2026 - තෙවන වාර පරීක්ෂණය

| | | |
|---|---|---|
| සිංහල - I<br>சிங்களம்<br>Sinhala I | 71 S I | 13 ශ්‍රේණිය<br>தரம் 13<br>Grade 13 |
| පැය තුනයි<br>03 மணித்தியாலம்<br>Three Hours | | අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි<br>மேலதி வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்<br>Additional Reading Time – 10 minutes |

## උපදෙස්

- පළමු ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- 01. පහත දැක්වෙන (අ) (ආ) (ඉ) (ඊ) හා (උ) උද්ධෘත අතුරෙන් **සතරක්** තෝරා ගෙන ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට ද, (ඌ) හා (එ) ප්‍රශ්නවලට ද පිළිතුරු සපයන්න. (මේ ප්‍රශ්නයට පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගන්න.)

**(අ)** යනු හෙයින් ළදරුවාණෙනි, යම් සේ මහත් ව ඇවිළෙන ගින්නක් දැක සත්පුරුෂ කෙනෙක් මේ ගිනි මෙ සේ ඇවිළ ඇවිළ තිබිලා ගම්වල ගෙවල වැද ගෙන ගම්ගෙවල් දවා පියා නමුත් බල බලා යාම තරම් නොවන්නේ වේ දැයි පැනක් හිස නිවා පියත් ද එ පරිද්දෙන් මාගේ සන්තානයෙහි දරුසෝක නැමැති ගින්න වැද ගෙන අදහස් නැමැති ගම්ගෙවල් දවනුවා තෙපි තොපගේ අනුශාසනා නැමැති පැනින් නිවා පුව. නැවත ශෝක නැමැති ශරයෙන් විත් කාපු මා තෙපි තොපගේ නුවණ නැමැති අතින් සෙමෙන් සෙමෙන් ශෝකශරය හරා පියා අනුශාසනා නැමැති බෙහෙදින් අදහස් නැමැති සැරපහරට බෙහෙත් කොට සුව කළව. එ සේ හෙයින් තොපගේ **මාලුකම** පිහිටා මෙවක් පටන් දරුසෝක නොකෙරමි. වියෝගයෙන් සරි වුවත් උන් ශෝක නො කරන කල මා කරණ ශෝකයෙන් වන්නේ ශරීර වියැළෙන පමණෙක; කථාව කරන කල කාරණ නොසැලකෙතත් පසු ව සලකන කලට නුවණැත්තවුන්ට යහපත් ව හැගෙයි. මටත් අනුශාසනා අසා හැම ම සැලසිණ. යම් කෙනෙක් පෙර පුරුදුකමක් නැති ව අමුතු ව ලා සහයක් වූ නම් උන් හැඳින්න මැනව.

(i) දැඩි ව ඇවිළෙන ගින්නක දී එය දකින සත්පරුෂයන් කවර ක්‍රියාවක් කරන්නේ ද?

(ii) මෙහි සඳහන් රූපකයක් උපුටා දක්වන්න?

(iii) ''පෙර පුරුදුකමක් නැති ව අමුතු ව ලා සහායක් වූ නම් '' මම උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.

(iv) **''මාලුකම''** යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

**(ආ)** එකියන සොරු පිළිස්සූ දඩ මස් නො දී අමු මාංශ දී යවූහ. චුල්ල ධනුද්දර කුමාරයෝ අමු මාංශ දැක කියන්නාහු "පිළිස්සූ මාංශ නොදී අමු මාංශ දුන්නේ අප කෙරේ **කනස්සලුවෙන්** දැ" යි කියා දෙවෙනි ව බිරින්ද අත අමු මාංශ යවන්නා සොරු පන්සියය කෝප වන. ඉන් එකෙක් "අප පන්සියය වෙහෙසයි දැ"යි කියා කෝපයෙන් දිවුවා වූ චුල්ල ධනුද්දරයෝ එකින් එකාට සොරු පන්සියය එකක් අඩු ඊදඬු පන්සියයෙන් විද එළූහ. සොරුන් නායක තැනැත්තේ ඉවත් ව සිට අවුත් චුල්ල ධනුද්දරයන් අල්වා ගත. සොර දෙටුවා හා ධනුද්දරයන් හා උනුන් කා සොරා යට කොට ඔබා ගෙන චුල්ල ධනුද්දරයෝ "සොඳුර කඩුව දී ලව"යි අත දික් කොට ලන්නා සොරාට කඩු මිට දී චුල්ල ධනුද්දරයන්ට කොපුව දීලූහ. සොරා චුල්ල ධනුද්දරයන් ඉස කපා මරා යන්නට නික්මුණු කලට ගඟක් සමීපයට පැමිණියාහ. **සොර දෙටුවා** සිතන්නේ බාල කල පටන් සරණ පුරුදු පුරුෂයා මරවා මා කෙරේ ලෝභ කළා ය. ඉදිරියේ අනිත් පුරුෂයෙක් දුටත් මටත් මේ කරණ මානය "යි සිතා මැගෙන් මට ප්‍රයෝජන නැතැ යි මැ මෙතන ම ඇරපියා යෙමි" යි සිතා.

(i) සොරා චුල්ලධනුද්ධර කුමරුගේ බිරියගෙන් තමාට ප්‍රයෝජනයක් නමැති බව සිතන්නේ ඇයි?

(ii) චුල්ල ධනුද්ධරයන් විද එළූ සොරුන් ගණන කීයද ?

(iii) ''උනුන් කා කොටා සොරා යට කොට ඔබා'' මෙම උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.

(iv) **''සොරදෙටුවා''** යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි)

**(ඉ)** ඉක්බිති ඒ රජකුමරුවෝ හැමදෙන ම රාජාංගණයෙහි රැස් ව හිඳ ''අපගේ ආචාරීන් වහන්සේ දක්නා කැමැත්තම්හ'' යි දූතයකු යවූහ; එකල ඒ දූතයාගේ බස් අසා බමුණාණන් අවුත් උන් කල්හි කලට සුදුසු වූ පිළිසඳර කථා කොට ඉක්බිති ''ආචාරීන් වහන්ස, නුඹ වහන්සේගේ භාර්යා වූ සවණීතිලකාවන් දක්නා කැමැත්තම්හ'' යි කීහ. එතෙපුල් අසා බමුණාණෝ ස්වණීතිලකාවන් කැඳවාගෙන එව'' යි මිනිසුන් යවූහ. ඒ ගිය මනුෂ්‍යයන් සවණීතිලකාවන් කැඳවා ගෙන වීථි මධ්‍යයට පැමිණි කල්හි මද නැඟී සිටි මොළ ඇතකු රා පොවා මත් කරවා ඇත් කොහොලින් ඇන කුප්පවා ඉදිරියට ලුහුබඳවා ලූහ; එකල්හි රා බී මත් ව කෝපයෙන් සොඬ ගෙන බිම පහරමින් මහත් වූ කුඤ්චනාදයෙන් දසදිග් පුරමින් ඒ ඒ අත මිනිසුන් ලුහුබඳවමින් සෙණ "පහරන සේ දිව අවුත් වන්නා වූ ඒ ඇත් තෙම සවණීතිලකාව දැක එකෙණෙහි උපන්නා වූ ස්නේහයෙන් සොඬින් ගෙන ඔසවා තමාගේ කුඹ මත්තෙහි තබා ගත.

(i) රාජාංගණයෙහි රැස් වූ රජ කුමරුවන් පැමිණි ආචාර්යවරයාට පැවසුවේ කුමක් ද?

(ii) ඇතා ස්වර්ණතිලකා ව දැක කුමක් කළේ ද?

(iii) ''මද නැඟී සිටි මොළ ඇතෙකු රා පොවා'' මෙම උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.

(iv) **''ඇත් කොහොළින්''** යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි)

**(ඊ)** නැවත ද බිම්බිසාර රජ්ජුරුවන් කරා පඬුරු හා දූතයන් යවූහ. එකල රජ්ජුරුවෝ ජීවකයන් කැඳවා "පුත, චණ්ඩප්‍රද්‍යෝත මා හා විශ්වාස ඇතියහ. මේ වාරයෙහි උත්තර නො කියා ගොස් උන් කීවාට වැනි ව උන් බලාපියා වී නමුත් එව"යි ජීවකයන් යවූහ. එකල ජීවකයෝ උදේනි නුවරට ගොස් රජ්ජුරුවන් දැක අවස්ථා බලා "මායමකින් බෙහෙත් තෙලක් පොවා මේ රජහුගේ ජීවිතය රැක දෙමි" යි සිතා "මා වැනි වෙදක්හු ඇස පෙනී ගිය ව්‍යාධිගත රජහු නැසී යාම සුදුස්සෙක් නො වෙයි. එසේද වුවත් මේ රජ චණ්ඩය. කාරණාකාරණ පරීක්ෂා නොකෙරෙයි. තෙල් පෙවූ විට ම ක්‍රෝධයෙන් මා මරවයි. මායමකින් තෙල් පොවා මොහුගේ ද මාගේ ද ජීවිත රක්ෂා කළ මනා වේ දැ"යි සිතා දේවයන් වහන්ස මේ ව්‍යාධිය සන්සිඳුවාලමි. කිසි බයක් නොකළ මැනැව. බල එකෙක් ඇත. වෙදවරු නම් ඖෂධයට ලෝභියහ. අනුන් ලවා බෙහෙත් නො ගෙන්වති. ඒ ඒ යෝගයෙහි ඒ ඒ ඖෂධයන් තුමූ තුමූ ම ස්ව හස්තයෙන් ගන්නාහුය. එසේ හෙයින් මාත් නුඹගේ මේ නුවර කැමති වාහනයකින් නැගී කැමති වාසලකින් කැමති යම් වේලෙක මා සිත් සේ ම යන එන සේ රැකවල් අළ මැනවැයි කීහ.

(i) ජීවකයන් සිතන ආකාරයට චණ්ඩප්‍රද්‍යෝත රජුගේ ස්වභාවය කවරාකාර ද?

(ii) රජුගේ ජීවිතය රැකීමට ජීවක කුමක් කිරීමට සිතයි ද?

(iii) 'උන් කීවාට වැනි ව උන් බලාපියා වී නමුත් '' මෙම උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.

(iv) **''ස්ව හස්තයෙන්''** යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි)

(උ) මෙලෙසින් පුරඳරා''
කී බස් අසා සොඳුරා
සිත සතොසින් පුරා
කීයැ මේ බස් මෙ අප ඇඳුරා

අවගුණයට පිවිසි
නර රකුසෙකු ලෙසින් දිසි
කළ ගුණ නොදත් කිසි
පව්ටු දුදනෙකු කෙළෙමි අතවැසි

(i) අතවැසියෙකු බවට පත්කර ගත්තේ කවරෙක් ද?

(ii මෙහි ඇති උපමාවක් උපුටා දක්වන්න.

(iii) අවගුණයට පිවිසි
නර රකුසෙකු ලෙසින් දිසි
මෙම උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.

(iv) **''පුරඳරා''** යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04 යි)

(ඌ) සහ (එ) ප්‍රශ්න දෙකට ම පිළිතුරු සපයන්න.

(ඌ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් හතරක අවස්ථා සම්බන්ධය දක්වන්න.

(i) ''පෙනෙන දේ ඉල්ලන හෙයින් තොපගේ අඥානකමෙක් නැත.''

(ii) ''මාගේ කිසි නෑසිය කෙනෙකුන් නැති''

(iii) ''තීගෙන් මට ප්‍රයෝජන නැත''

(iv) ''උන් දැන් නො එන්නේ තුන් අවුරුද්දකැ''

(v) ''මතක තියා ගනින් අපෙ අප්පොච්චිගෙ ගුරුන්නාන්සෙ සිංහලේ මිනිහා

(vi) ''පොඩි එකා බඩගින්නෙ අඬනවා දැකලා මම අතේ තිබුණු පිඟානෙන් දමල ගැහුව''

(vii) ''මා යවන්නට කැමති ද ඔබ -
නිරතුරු ඇවිටිලි කරන්නෙ'' (ලකුණු 3x4=12යි)

**(එ)** අද්දැකීමට යෝග්‍ය පරිදි භාෂාව යොදා ගැනීම පිළිබඳ අවධානය යොමු කරමින් පහත දැක්වෙන පද්‍ය **නිර්මාණය පිළිබඳ රසාස්වාදයක් කරන්න.**

**ඉගිලෙන සිහින**

මිනිහා නගන කටහඬ නො ම වැහෙන    කනේ
ඇත මේ කුරුලු කූඩුව උස ගසක    බෙනේ
නැත උවදුරක් මෙහි මෙතුවක් පහළ    වුණේ
පැටවගෙ කුඩා දෙනෙතට නිල් අහස    පෙනේ

උණුසුම් ගතිය ඇති මුත් සිය    කැදැල්ලෙහි
පැටවා කැමති නැත හිර වී    විසිල්ලෙහි
දෙනෙතට නිල් අහස යොමු වන    ඇසිල්ලෙහි
ඔහු යෙදෙනවා නිදහස ගැන    සෙවිල්ලෙහි

මවුපිය කුරුල්ලන් රැකවරණය    ඇතුව
උන්ගේ ආලයේ වෙසෙතත්    ගජමුතුව
පැටවගෙ දෙනෙත පවතී කවදත්    රතුව
සැපතක් ඔහුට නැත ඉගිලෙන්නට    නැතුව

දවසට සිය විටක් මවු පිය දෙදෙන    විසින්
කටට ම හෙළන මුත් ආහර කුරුලු    රසින්
පිට වන තුරා ඔහු හිර වී සිටින    ගසින්
ඉගිලෙන සිහින පිටමං කළ නොහැක    සිතින්

අරුණලු වැටෙයි පොඩි සිදුරෙන් කුරුලු    ගෙට
ගී හඬ පිටත් වෙයි රුක් ලිය මුදුන    සිට
කවුළුව තුළින් එළියට හිස දමන    විට
හොඳ බව පෙනෙයි මෙහි ඇතුළට වැඩිය    පිට

උවදුරු එමට ඇති මුත් එළිමහන    තුරේ
පැටවට පෙනෙයි එහි පවතින කුරුලු    පොරේ
කොපමණ කලක් ගත වේවි ද මෙහෙම    හිරේ
සිතිවිලි නිසා ඇති නිදිබර ගතිය    හැරේ

සටනක් නැතිව සැපතක් ඇති විය    නොහැක
මේ රැකවරණ තුළ ඇති සුවසිරි    දුකෙක
උවදුරු දිගේ යන දිග මාවත    මිසක
නිදහස කරා යන වෙන පාරක්    කිමෙක

මවුපිය කුරුල්ලන් ආහර රැගෙන    කටින්
ආවා පුරුදු ලෙස පැටියා දකින    අටින්
දුටුවා හිස්ව ඇති බව ගෙය එහෙම    පිටින්
පැටවා ගිහින් එළිවෙන කොට හතර    වටින්

(ලකුණු 12 යි)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

2. සදහම් මගෙහි පොදු ජනයා යොමු කරවීම සඳහා සද්ධර්මරත්නාවලි කතුවරයාගේ කතා කලාව මනා පිටුවහලක් වූ අයුරු නිර්දිෂ්ට කථා ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 15 යි)

**නැතහොත්**

ජීවිතාවබෝධයෙන් යුතුව ස්වාමි-භාර්යා අන්‍යෝන්‍ය සම්බන්ධය ඇතිවීමේ අයශ්‍යතාව ජාතක කථා මගින් මැනවින් පිළිබිඹු කරවයි. නිර්දිෂ්ට කථා ආශ්‍රයෙන් විමර්ශනය කරන්න.

(ලකුණු 15 යි)

3. (අ) ගම්පොළ යුගය සිංහල සාහිත්‍ය ඉතිහාසයට සුවිශේෂ වන අයුරු පැහැදිලි කරන්න

(ලකුණු 07 යි)

(ආ) සමාජයේ ප්‍රචලිත වෘත්තීන් දෙකක් මගින් මිනිස් දිවිය පිළිබඳ මනා විවරණයක් ඉදිරිපත් කිරීමට පූජාවලිය කතුවරයා සමත් වෙයි. නියමිත් කථා ඇසුරෙන් විමසන්න.

(ලකුණු 08 යි)

**නැතහොත්**

අසීමිත ආශාවන් සන්තර්පණය උදෙසා ක්‍රියා කිරීමෙන් පුද්ගලයා විපතට පත් වන බව දැක්වීම සඳහා සද්ධර්මාලංකාර කතුවරයා චරිත නිරූපණය කර ඇති ආකාරය නියමිත කථා ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08 යි)

4. ගුත්තිල කාව්‍ය කතුවරයා උදේනි පුර සැණකෙළි වර්ණනයේ දී එය විචිත්‍රවත් ව ඉදිරිපත් කිරීම සඳහා යොදාගත් කාව්‍යෝපක්‍රම පිළිබඳ ව නියමිත වර්ණනය ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 15 යි)

5. අවාසනාවන්ත ඉරණමකට මුහුණ දෙන ගැමියන්ගේ ශෝකාන්තය බැද්දේගම නවකතාවෙන් නිරූපණය කිරීම වඩාත් සාර්ථක වූයේ අවස්ථා හා සිද්ධි මනා ව නිරූපණය කිරීම හේතුවෙනි. උදාහරණ සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 15 යි)

6. කෙටිකතාවක මූලික ලක්ෂණ යොදා ගැනීමටත්, සමාජ යථාර්ථයන් නිරූපණය කිරීමටත් කෙටිකතාකරුවා සමත් වූ අයුරු ''නිදහස් උදෑසන" කෙටිකතාව ඇසුරෙන් නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 15 යි)

7. නිදහස් කවියේ පළමු තරංගයේ කවීන් සිය කාව්‍ය නිර්මාණ සඳහා නව්‍ය අරමුණු යොදා ගනු ලැබිණි. අදාළ පද්‍ය නිර්මාණ තුනක්වත් ඇසුරෙන් විමසන්න. (ලකුණු 15 යි)

8. නාට්‍යකරුවාගේ අරමුණ වූයේ රසනිෂ්පත්තිය තුළින් ජීවන දර්ශනයක් ඉදිරිපත් කිරීමයි. පෙමතො ජායති සොකො නාට්‍යයෙන් නිදසුන් දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 15 යි)

***

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Sabaragamuwa Provincial Department of Education
சபரகமுவ மாகாணக் கல்வி திணைக்களம்

# අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය - 2026
## තෙවන වාර පරීක්ෂණය

සිංහල - II
சிங்களம்
Sinhala I

71 | S | II

13 ශ්‍රේණිය
தரம் 13
Grade 13

පැය තුනයි
03 மணித்தியாலம்
Three Hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதி வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time – 10 minutes

- අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

### උපදෙස්

- I කොටසේ 1 ප්‍රශ්නද, II කොටසේ 2, 3 ප්‍රශ්න ද ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- 1 ප්‍රශ්නයේ ඇති සියලුම අනුකොටස්වලට මෙම ප්‍රශ්නපත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- I කොටස II කොටසේ පිළිතුරු පත් සමඟ අමුණා භාර දෙන්න.

## I කොටස

01 එක් එක් ප්‍රශ්නයට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරා ගෙන, එයට හිමි අංකය වරහන තුළ ලියන්න.

1.1. අර්ධානුනාසික්‍ය අක්ෂර පමණක් යෙදී ඇති වර්ණය තෝරන්න.
(1) ඞ, ඤ, ණ, න, ම
(2) ඟ, ඦ, ඬ, ඳ, ඹ
(3) ඛ, ඡ, ඨ, ඪ, ඵ
(4) ශ, ෂ, ණ, ජ, ඹ
(5) ය, ර, ල, ව
(.........)

1.2. නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න.
(1) අත්පොළසන්, අත්‍යාන්ත, අතකොළුව, අතැඹුළ
(2) අත්පොළසන්, අත්‍යාන්ත, අතකොළුව, අතැඹුළ
(3) අත්පොලසන්, අත්‍යන්ත, අතකොළුව, අතැඹුල
(4) අත්පොළසන්, අත්‍යන්ත, අතකොලුව, අතැඹුල
(5) අත්පොළසන්, අත්‍යන්ත, අතකොළුව, අතැඹුල
(.........)

1.3. අකාරාදී පිළිවෙළ අනුව නිවැරදි ව ලියා ඇති පද පේළිය තෝරන්න.
(1) කුඩලිගම, පලන්සූරිය, කුමාරගම, මානවසිංහ
(2) ගුණසිංහ, හතුරුසිංහ, කොඩිතුවක්කු, දිසානායක
(3) මුනිදාස, අමරසේන, තෙන්නකෝන්, අහුබුදු
(4) අමරසේකර, ගුණසිංහ, දිසානායක, සේනානායක
(5) රාජපක්ෂ, ගලප්පත්ති,විජේසිංහ,වීරසිංහ
(.........)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

1.4. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිරවද්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) ස්වර යනු තනි ව ශබ්ද කළ හැකි අක්ෂරය.
(2) ස්වර යනු වායු ධාරාවට බාධා පමුණු වන අක්ෂරයි.
(3) ව්‍යංජන ශබ්දයකට ස්වරයක් එක් වූ විට සෑම ස්වරයකට ම පිළි යෙදේ.
(4) ස්වර වචනයක්අග දී තනිව යෙදේ.
(5) ස්වර කොටස් පහකට බෙදේ. (.........)

1.5. එකිනෙකට අනුරූප වන සේ වචන යුගල යෙදී ඇති වරණය තෝරන්න.

1. සම්බන්ධ විභක්ති, පෙර දිග භාෂා, මෛත්‍රී භාවනාව, නිධාන වස්තුව
2. පෙර විබත, ආශිර්වාද ප්‍රාර්ථනය, සංස්කෘත කාව්‍ය, උත්තර ප්‍රදේශ
3. පැරණි නෂ්ටාවශේෂ, පස්පව්, දම්සෝ නිරිඳු, අපේක්ෂා භංගත්වය
4. සූර්ය රැස්, සූත්‍ර පිටකය, මඟුල් චාරිත්‍ර, පාඨශාලා ආචාර්ය
5. දිය ධාරාව, ඖෂධ වර්ග, වෙසක් උලෙළ, ජාත්‍යන්තර මිතුදම (.........)

1.6 තත්සම පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.

1. ජලය, විදුලිය, වාතය, සුළඟ
2. විද්‍යුතය, ධ්වනිය, නාදය, නිද්‍රාව
3. පද්‍ය, සූක්ෂම, පිළිවෙත, මඩුල්ල
4. පුෂ්පය, පරාගය, රොන්සුණු, දම්කඳ
5. සඟපෙළ, අභියාචනය, වලාකුළු, වායු ධාරව (.........)

1.7 තද්භව වචන පමණක් අන්තර්ගත වරණය කුමක් ද?

1. ලකුණු, පහන්, බ්‍රාහ්මණ, නිර්වාණ
2. සමණ, පාෂාණ, ධ්‍යාන, භාවනා
3. නිවන්, බමුණු, උවටැන්, දැහැත්
4. පාෂාණ, ලක්ෂණ, ගණ්ඨාව, වර්ණ
5. වෘක්ෂ, මනුෂ්‍ය, ප්‍රතිමා, නාටක (.........)

1.8 සම්බන්ධ, කරණ, කර්තෘ හා කර්ම යන විභක්තිවලට අයත් සමාස පද දක්වා ඇති වරණය තෝරන්න.

1. මල්මාලා, රාජභෝජන, දෙව්දත්, ගවපල්
2. රාජභෝජන, මල්මාලා, දෙව්දත්, ගවපල්
3. ගවපල්, රාජභෝජන, දෙව්දත්, මල්මාලා
4. දෙව්දත්, ගවපල්, රාජභෝජන, මල්මාලා
5. මල්මාලා, දෙව්දත්, ගවපල්, රාජභෝජන (.........)

1.9 කෘදන්ත පදයක් ඇතුළත් **නොවන** වරණය තෝරන්න.

1. නැටුම්, ගැයුම්, වැයුම්, රැඟුම්
2. වැව්ලි, කෙඳිරිලි, දිව්ලි, පැනිලි
3. යනු, එනු, බලනු, දුවනු
4. ලියමන්, කියමන්, අවමන්, වියමන්
5. නටන, ගයන, වයන, දුවන (.........)

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

1.10 පහත සඳහන් උද්ධෘතවල **තද කළු අකුරින්** මුද්‍රිත පද අයත් ක්‍රියා වර්ගය පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

අ ''දුදනන් හට පිහිට **නොවව්**''

ආ ''**කියත** උන් මෙතෙපල. ආයේ ය ඇඳුරු ගුත්තිල''

ඇ ''**නටත්** අයෙක් සුරා මතින්''

ඈ ''**කියමින්** ගී රස මියුරු''

1. අසම්භාව්‍ය ක්‍රියා, විධි ක්‍රියා අවසාන ක්‍රියා, මිශ්‍ර ක්‍රියා.
2. විධි ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අවසාන ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා
3. විධි ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, අවසාන ක්‍රියා, මිශ්‍ර ක්‍රියා
4. මිශ්‍ර ක්‍රියා, විධි ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, අවසාන ක්‍රියා
5. අවසාන ක්‍රියා, විධි ක්‍රියා, පූර්ව ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා (.........)

1.11 තද්ධිතයක් **නොවන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

1. අරටු, කැහැටු, බොකුටු, නකුටු
2. දිරිමත්, සිරිමත්, ඉසුරුමත්, රූමත්
3. පාපතර, මධුරතම, ජ්‍යෙෂ්ඨතම, උදාරතර
4. ගුණවන්ත, කරුණාවන්ත, බලවන්ත, ඥානවන්ත
5. වෙරළත, ලවනත, සවනත, මුහුණත (.........)

1.12 උපසර්ගයක් යෙදී **නැති** පදයක සහිත පද පේළිය තෝරන්න.

1. සුදන, සුරූපී, සුගුණ, සුවිනීත
2. අවනඩු, අවගුණ, අවබෝධ, අවසාන
3. දුෂ්කර, දුශ්ශීල, දුෂ්පෝෂණ, දුස්සාධ්‍ය
4. අනුකූල, අනුනායක, අනුරූප, අනුශාසනා
5. ඉමහත්, ඉපැරණි, ඉමිහිරි, ඉබොහෝ (.........)

1.13 නිපාතයක් **නොවන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

1. නිති, නිබඳ, නිතර, නිරතුරු
2. එම්බා, එම්බල, බොල, කොල
3. තෙක්, දක්වා, තුරු, පටන්
4. සඳහා, පිණිස, වස්, තකා
5. විතර, පමණ, විපුල, තරම් (.........)

1.14 **සතරපෝයට** ම සිල්ගන්නා **සිල්වත්තු** වෙසක් පෝයදා **මලසුන** මත මල් පුදා පිං රැස් කර ගත්තෝ ය. යන වාක්‍යයෙහි වචන යෙදී ඇති පිළිවෙළඅනුව තද කළු අකුරින් දක්වා ඇති පද අයත් වන්නේ කුමන ව්‍යාකරණ අංගවලට ද?

1. තද්ධිත, සමාස, සන්ධි
2. සමාස, තද්ධිත, සන්ධි
3. සන්ධි සමාස තද්ධිත
4. සමාස, සන්ධි, තද්ධිත
5. තද්ධිත, සන්ධි, සමාස (.........)

PAST PAPERS WIKI

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

1.15 සමාන ව්‍යාකරණ ලක්ෂණ නිරූපණය **නො කරන** ක්‍රියා රූපය සහිත වරණය තෝරන්න.

1. කැපුණු, ගැයුණු, කෙටුණු, ලියූ
2. කැපූහ, නැසූහ, කෙටූහ, ලියූහ
3. කරයි, මරයි, තෝරයි, හඬයි
4. කීවාය, කෑවාය, ගෑවාය, නෑවාය
5. හැපීය, කැපීය, සිතීය, වැරීය (.........)

1.16 සමාසයක් **නොවන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.න

1. හේන්මිරිස්, වනමල්, රහල්තෙර, බවදුක
2. ගල්බනිස්, මාළු බනිස්, සීනි බනිස්, කිඹුල බනිස්
3. සුධර්ම, සුචරිත, සුගාම, සුනීත
4. දුරුතුමස, මැයිමස, බක්මස, බිනරමස
5. ප්‍රේම සවාරි, ප්‍රේමතටාක, ප්‍රේමකාව්‍ය, ප්‍රේමවන්ත (.........)

1.17 එකම වර්ගයට අයත් සන්ධි පද අන්තර්ගත වරණය තෝරන්න.

1. නිරිඳු, තරිඳු, කිවිඳු, තෙරිඳු
2. ගොක්කත්ත, මල්ලත්ත, තල්ලත්ත, රැක්කත්ත
3. ගිනියම්, සිතියම්, පිරියම්, ගෙත්තම්
4. නෙලුම්මල්, ගංවතුර, ගම්පොළ, දඬුවම්
5. නිරවුල්, නොයෙක්, ගෙවුයන්, මොහොර (.........)

1.18 ව්‍යාකරණානුකූල ව නිවැරදි වැකිය තෝරන්න.

1. දකුණත, යනෙන, සුරිඳු, හිඟුරල
2. මැටිබඳුන්, කිරිබත්, රන්කම්, මිරිස්කුඩු
3. විසින්, බඳු නොහොත්, කෙරෙන්
4. අප, උප, අදි, අති
5. ස්වර්ණමය, රන්මුවා, සිල්වත්, බීමත් (.........)

1.19 ලේඛන ව්‍යවහාරයට වඩාත් සුදුසු වාක්‍ය සහිත වරණය තෝරන්න.

1. සියලු ලෝකවාසීන් සාමකාමී සිතැත්තෝ වේවා
2. මා එහි යතොත් ඔවුන් සතුටු වෙති.
3. කලාකරුවෝ මෘදු සිතැත්තෝය.
4. ඈ නිළියක් මෙන් රඟයි
5. මම ද සොහොයුරිය ද නිතර එහි යති (.........)

1.20 ලේඛන වසවහාරයට වඩාත් සුදුසු වාක්‍ය සහිත වරණය තෝරන්න.

1. ඔබ මා එක්ක තරහ වන්නේ ඇයි?
2. ඇති යන්තන් උගුලෙන් බේරුණා.
3. බොහෝ අවස්ථාවල ඔවුන්ගේ තීරණ නිවැරදිය.
4. තාන්න මාන්න තිබිලා මක්කටෙයි දන් දෙන හිතක් නැතුව
5. (1)කළොත් කරන්නේ මුස්පේන්තු වැඩක් මයි (.........)

## II කොටස

02\. අ. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

නගර කර සංක්‍රමණය වන බොහෝ පුද්ගලයන්ට තමා පදිංචිව සිටි ප්‍රදේශය අහිමි වීම ප්‍රබල ව බලපාන කරුණකි. නගරයේ දී තමාට නුපුරුදු පරිසරයක, නොදන්නා සංස්කෘතියක වාසය කිරීමට සංක්‍රමණිකයාට සිදු වේ. මෙලෙස පෞද්ගලික වශයෙන් දැනෙන පීඩාව හේතුවෙනුත්, විශේෂයෙන් සංක්‍රමණයේ මුල් වකවානුවේදීත් ඒකාරාශී වීමක් සිදු වේ.

මේ ලක්ෂණය නගරයක් තුළ නිරායාසයෙන් සිදුවන අපූර්ව ක්‍රියාවලියකි. බොහෝ විට සංක්‍රමණය වන අයෙකුට නගරයේ පෙර හැඳුනුම්කමක් වේ. ඒ අනුව සංක්‍රමණය සිදු වේ. මේ සංක්‍රමණිකයන්ට පහසුකම් සලසන පිරිස් සමඟ කාලයක් වාසය කරයි. මේ අනුව තමාගේ අය සමඟ ඒකරාශි වීමක් අනිවාර්යයෙන් සිදු වේ. ඇමරිකාවේ නිව්යෝර්ක් නගරයේ පිහිටි ''චයිනා ටවුන්'' හා ''ඉන්දියන් සිටි'' හි ජීවත් වන පිරිස් එකම වාර්ගිකත්වයකට අයත් ජනපදිකයන් ය. මේ පිරිස් තමා අයත් සංස්කෘතිය රකිමින්, විඳිමින්, තම තමාගේ ආරක්ෂාව සංවර්ධනය උදෙසා තම මවු රටින් පිටත ඒකරාශීව ජීවත් වෙති.

මේ වාර්ගික ඒකරාශී වීම ආර්ථික මට්ටම අනුව තීරණය වේ. සංක්‍රමණය වූ මුල් කාලයේ ආරක්ෂාව මුල් කර ගනිමින් ඒකරාශී වුවත්, ඒ ප්‍රදේශයට අනුගත වූ පසු ස්වාධීනව කටයුතු කරන ස්වරූපයක් දැකගත හැකිය. කෙසේ නමුත් එකම වර්ගයේ රැසක් එක්ව වාසය කිරීමෙන් නාගරික ජීවිතය පහසු කරවයි.

සංක්‍රමණ ධාරාව ක්‍රියාත්මක වීමට මූලික වශයෙන්ම ඉටු විය යුතු කරුණක් වනුයේ ගමනාරම්භ ප්‍රදේශයෙන් තල්ලු කිරීමේ සාදක පැවතීමයි. මේ ඇද ගැනීමේ සාදක අතරින් හිතමිතුරන් සිටීම, ඥාතීන් සිටීම ජාතිකත්වය වැනි සාධක ප්‍රධාන වේ. මේ අනුව සංක්‍රමණිකයාගේ ගමනාන්තය හිතවතකු ගේ නිවස අසල නිවසක හෝ ඥාතියෙකුගේ නිවස අසල සිදුවිය හැකිය.

i. සංක්‍රමණිකයාට පීඩාවන් දැනීමට හේතු මොනවාද?

ii. වාර්ගික ඒකරාශී වීම තීරණය කරන සාධකය කුමක් ද?

iii. සංක්‍රමණිකයන් මුල් කාලයේ කටයුතු කරන ආකාරය පසුව වෙනස් වන්නේ කෙසේ ද?

iv. මෙහි දැක්වෙන පරිදි ගමනාන්ත ප්‍රදේශයට ඇද ගැනීමට බලපාන ප්‍රධාන සාධක මොනවාද?

v. සමාන වාර්ගිකත්වය සහිත ජනපද සඳහා මෙහි දැක්වෙන උදාහරණ මොනවාද?

vi. යම් ප්‍රදේශයකට සංක්‍රමණය වීම සිදු වීමට බලපාන කරුණු මොනවාද?

(ලකුණු 12)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

ආ. පහත දැක්වෙන උද්ධෘතය කියවා, එහි වචන සංඛ්‍යාව තුනෙන් එකක් පමණ වන සේ සාරාංශ කොට ලියා සාරාංශය අග වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

සමාජ ක්‍රමය පිළිබඳ ගුණාත්මක තොරතුරු ලබා ගැනීම සඳහා යොදා ගනු ලබන විධික්‍රමයක් ලෙස නිරීක්ෂණාත්මක අධ්‍යයන දැක්විය හැකිය. මෙහි දී පර්යේෂකයා හෝ පර්යේෂණ කණ්ඩායම විසින් තමන් අධ්‍යනය කරන සමාජයෙහි කුමක් සිදුවන්නේ දැයි නිරීක්ෂණය කරනු ලැබේ. එමෙන් ම ඔවුන් සමාජය වෙත කිසියම් හෝ බලපෑමක් කර එය තමන් අපේක්ෂා කරන පරිදි පාලනය කිරීමට හෝ වෙනස් කිරීමට හෝ කටයුතු නොකරයි. සමාජය තුළ කුමක් සිදු වෙමින් පවතින්නේ දැයි පරීක්ෂා කර බැලීම පමණක් එහි දී පර්යේෂකයා විසින් ක්‍රමානුකූල ව කරනු ලැබේ.

විධිමත් නිරීක්ෂණය මූලික ප්‍රභේද කිහිපයකට බෙදා දැක්විය හැකිය. විද්‍යාගාර නිරීක්ෂණ ක්‍රමය ඒ අතරින් එක් ප්‍රභේදයක් වන්නේ ය. විද්‍යාගාර නිරීක්ෂණ ක්‍රමයේ දී සමාජ විද්‍යාඥයා විසින් සිය වටපිටාව උවමනා පරිදි පාලනය කරනු ලැබේ. පර්යේෂකයාගේ නිරීක්ෂණයට ලක්වන විශේෂතම සිද්ධීන් සිදුවෙමින් පවතින්නේ එලෙස පාලනය කරන ලද පරිසරය තුළ ය. කාමරයක ජනේල භාවිත කරමින් අධ්‍යනයට ලක් වන සිද්ධිය කෙරේ එමඟින් කිසියම් බලපෑමක් කිරීමට පර්යේෂකයා උත්සාහ දැරීය.

දෙවන ප්‍රභේදය යටතේ පර්යේෂණයන් සිදුවනුයේ සාමාන්‍ය ස්වභාවික සමාජ වටපිටාවෙහි ය. සාමාන්‍යයෙන් මෙම ක්‍රමය ක්ෂේත්‍ර නිරීක්ෂණ ක්‍රමය යනුවෙන් හඳුන්වනු ලැබේ. මෙහිදී නිරීක්ෂණය සිදු වන්නේ පර්යේෂකයා විසින් ගැටලු අධ්‍යනය සඳහා තෝරා ගනු ලැබූ ප්‍රදේශ වලය. ඒ අනුව කෙනෙකු පංති කාමරයක සිසුන්ගේ හැසිරීම නිරීක්ෂණය කළ හැකිය. තුන්වන ක්‍රමය සහභාගි නිරීක්ෂණ ක්‍රමය ලෙස හඳුන්වනු ලැබේ. මෙහි දී තමා අධ්‍යයනය කරන සමාජයේ කොටස්කරුවකු ලෙස පර්යේෂකයා ද එහි සිදු වෙමින් ඇති සියලු කටයුතුවලට සහභාගී වීම විශේෂත්වයකි.

(ලකුණු 13)

03. දී ඇති මාතෘකාවලින් එකකට අදාළ ව වචන 300 - 350 අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූල ව ලියන්න.

1. වර්තමාන ශ්‍රී ලාංකීය අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හා රැකියා වෙළෙඳපොළ
2. බලවතුන් අතර හට ගැනෙන යුද ගැටුම් හේතුවෙන් පීඩාවට පත්වන ළමා ප්‍රජාව
3. සයිබර් අපරාධ සහ ඩිජිටල් ආරක්ෂාව
4. සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය නිසා ශ්‍රී ලාංකීක ආර්ථිකයට සිදුවන වාසි
5. ළමා මානසික සෞඛ්‍ය ප්‍රවර්ධනයට ළමා සාහිත්‍ය කෘතිවල බලපෑම

(ලකුණු 25)

04. (අ) පහත සඳහන් වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.

1. දායකයෝ දහම් මඟ යත් නම් ස්වාමීන් වහන්සේ එය අගයති.

2. යුද්ධය නිම වූ පසු ලෝකවාසීහු සතුටින් දිවි ගෙවාවි.

3. ඉන්දීය ක්‍රිකට් කණ්ඩායමේ නොහික්මුණු යොවුන් ක්‍රීඩකයෝ ඇත.

4. ගොවීන් සමඟ ගෙවිලියන් උද්ඝෝෂණයට ගියහ.

5. සඟ ගණ පිඬු සිඟා වඩියි. (ලකුණු 05)

(ආ) පහත සඳහන් වාක්‍ය කර්මකාරයට හරවන්න.

i. ලෝක නායකයෝ සාම ගිවිසුමක් අත්සන් කරති.

ii. ගම්වැසියෝ වනඅලින් පලවා හරිති.

iii. අමාත්‍යවරයා නව ලේකම්වරයා සේවයෙන් ඉවත් කළේ ය.

iv. ජනාධිපතිවරයා නිලධාරීන් ලවා ඩෙංගු මර්දන වැඩසටහන් ක්‍රියාත්මක කරවයි.

v. දෙමව්පියෝ තොප ආරක්ෂා කළහ. (ලකුණු 05)

(ඉ) නිවැරදි වාක්‍යයක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පදය වරහන් තුළින් තෝරා ලියන්න.

1. (සියොත්හු/ සියොතුන්) හිමිදිරි උදෑසන සුමියුරු ගී (ගයයි/ ගයති)

2. (අප/ අපි) තරගයට යද්දී මවගේ ඇසෙහි කඳුළු (පිරුණාය/ පිරිණි)

3. (මම/ මා) විභාගයෙන් සමත් වෙති'යි (ගුරුවරියක/ ගුරුවරියක්) කීවා ය.

4. සාගර පලන්සූරිය (හෙවත්/ නොහොත්) කේයස් ''සුදෝ සුදූ''(ලියනු ලැබුවේය./ලියුවේ ය.

5. (ශිෂ්‍යයෝ/ ශිෂ්‍යයන්) සුදු ඇඳුමෙන් පාසලට එත් නම් (ගුරුවරු/ ගුරුවරුන්) ද එය අගයනු ඇත. (ලකුණු 05)

05. (අ) පහත දැක්වෙන වාක්‍යවල **තද කළු අකුරෙන්** මුද්‍රිත පදවල ව්‍යාකරණ අංගය දක්වා ඇත. ඒවායෙහි අනු අංගය දක්වන්න.

i. **දිගත පතළ** සුවඳැති සොඳ **සඳුන්කඳ**
(දිගත - සන්ධි, පතළ - කෘදන්ත, සඳුන් කඳ - සමාස)

ii. **පාසැල්වල ප්‍රමුඛතාව** ලැබිය යුත්තේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය **උදෙසා** ය.
(පාසල් වල - විභක්ති, ප්‍රමුඛතාව - තද්ධිත, උදෙසා - නිපාත)

iii. නාමල් **හිනැහෙමින්** උඩ **පනිද්දී** උදිත **නිහඬ** ව බලා සිටියේ ය.
(හිනැහෙමින් - ක්‍රියා, පනිද්දී - ක්‍රියා, නිහඬ - උපසර්ග)

iv. **මලගෙටියෙන්** පැන් **පොවමින් අතිතතින**
(මලගෙටියෙන් - විභක්ති, පොවමින් - ක්‍රියා, අතිනතින - සන්ධි)

v. **හෙළබස** නගා සිටුවීම **පිණිස කුමාරතුංගයෝ** අතිමහත් සේවයක් ඉටු කළහ.
(හෙළබස - සමාස , පිණිස - නිපාත, කුමාරතුංගයෝ - විභක්ති) (ලකුණු 3 × 5 = 15)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

06. (අ) පහත දැක්වෙන වාක්‍යවල හිස්තැනට වඩාත් ම ගැළපෙන පදය වරහන් තුළ දී ඇති පද අතුරෙන් තෝරා ලියන්න.

(පතළ, නිරවද්‍ය, විදේශීය, පතල, නිවැරදි, විදෙස්)

1. ලොව ......................... ගත් කතුවරයෙකු වශයෙන් ෆ්‍රාන්ස් කෆ්කා කෙටිකතාකරණය බැබළ වීය.
2. නිවේදන කටයුතු වලදී ව්‍යවහාරය අතිශයෙන් ම වැදගත් ය.
3. .........................රාජ්‍ය නායක සමුළුව ජිනීවාහි පැවැත්වේ.
4. ඔවුන් විසින් කණින ලද මැණික් ......................... ඉතා විශාල එකකි.
5. රූපවාහිනියේ ......................... පුවත් විකාශනය වන්නේ දේශීය පුවත්වලින් අනතුරුවයි.
6. රටක අනාගත අභිවෘද්ධියට ගුරුවරුන් සතු ......................... ඉවහල් වෙයි.

(ලකුණු 1/2 × 6 = 3)

(ආ) පහත දක්වා ඇති පද **සන්ධි** කරන්න.

1. ප්‍රබන්ධ + උපාය
2. පරි + ඊක්‍ෂණ
3. සිති + කම්
4. බුදු + සරණ
5. මුගු + පියළි
6. නන් + අරුත්

(ලකුණු 1/2 × 6 = 3)

(ඉ) තද කළු අකුරින් මුද්‍රිත පදවල **විභක්තිය** නම් කරන්න.

i. වනයෙහි පිපි මල් පරිසරය හැඩ කරයි.
ii. සොයුරනි, මවුරටට ආදරය කරන්න.
iii. උගතුන් විසින් ලොව පුරා ප්‍රඥාව පතුරවයි.

(ලකුණු 1/2 × 6 = 3)

(ඊ) අවශ්‍ය තැන්වල විරාම ලකුණු යොදා පහත දැක්වෙන වාක්‍ය නැවත ලියන්න.

i. විටෙක රළ පෙළ ඉපිලෙයි සිනාසෙයි. සමුදුර කෙතරම් මනරම් ද
ii. කොළඹ කොටුව යාපනය දක්වා ධාවනය වන දුම්රිය පෙව 6.00ට වේදිකාවට පැමිණෙයි.
iii. මට බුදුන්ගේ සරණ ලැබේවා යි බැතිමතා කීවේය.

(ලකුණු 1/2 × 6 = 3)

(උ) පහත දැක්වෙන එක් එක් ප්‍රකාශ ප්‍රකෘති කථනය විකෘති කථනයට හරවා ලියන්න.

i. ''දරුවෙනි හෙට පාසලට නොඑන්න'' යි ගුරුතුමා පැවසී ය.
ii. ''අපි රට වෙනුවෙන් අපගේ ජීවිත පරිත්‍යාග කරමු''යි නායකයෝ කීහ.
iii. ''නිලධාරීන් ආයතනයෙන් පිට වී යද්දී කම්කරුවෝ කෑගසමින් සිටියහ'' යි වාර්තාකරු පැවසීය.

(ලකුණු 1 × 3 = 3)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

07. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

විවිධ යුද්ධෝපක්‍රම භාවිත කළ පැරණි **රජවරුන්** ඒ ඒ **අවස්ථාවන්හි** දී අවස්ථානුකූල ක්‍රමෝපායන් හරහා විදේශ **ආක්‍රමණිකයන්ට** සාර්ථක ව මුහුණ දී ඇත. ආර්ථික ස්ථාවරත්වය ඇති කරමින්, ආගමික සහ සංස්කෘතික **අංශයන්**[5] හරහා ශ්‍රී ලංකිකයා තුළ අභිමානවත් **ප්‍රෞඪ**[4] නොසැලුණු මනසකින් මුහුණ දීමට පූර්ව සූදානම ඇති කළ බවට ද **සාක්ෂි** ඇත. ඕනෑ ම අභියෝගයක් හමුවේ නොසැලී, නොතැවී අකම්පිත සිතකින් අතීත **ලාංකීකයා** රටේ සුරක්ෂිතතාවය උදෙසා ක්‍රියා කළ බව පෙනී යන කරුණකි.

i. තද කළු අකුරින් මුද්‍රිත වචන අකාරාදී පිළිවෙළින් පෙළ ගස්වා ලියන්න.

ii. සතුරු, අභියෝගයක්, සූදානම යන වචනවල යෙදී ඇති පිළි වෙන වෙන ම ලියන්න.

iii. ඡේදයෙහි ඇතුළත්,

- අර්ථ භූෂණාර්ථයේ උපසර්ග පද දෙකක් සහ විරුද්ධාර්ථයේ උපසර්ග පදයක් උපුටා දක්කවන්න.

iv. යුද්ධෝපක්‍රම, අවස්ථානුකූල, ක්‍රමෝපාය යන වචන විසන්ධි කරන්න.

v. මෙම ඡේදයේ ඇතුළත් ඌෂ්මාක්ෂරයක්, අඝෝෂ මහප්‍රාණ අක්ෂරයක් හා අන්තඃස්ථ අක්ෂරයක් පිළිවෙළින් යෙදුණු වචනයක් උපුටා දක්වන්න.

(ලකුණු 1/2 × 6 = 3)

8. පහත සඳහන් මාතෘකාවලින් තුනක් තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.

01. ස්වර සන්ධිය

02. විධි ක්‍රියාව

03. භාව කාරක කෘදන්ත

04. විශේෂණ සමාසය

05. නාම විශේෂණ (ලකුණු 05)

**

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

**අ.පො.ස. උසස් පෙළ - සිහල භාෂාව**

**13 ශ්‍රේණිය 2026 - තෙවන වාර පරීක්ෂණය**

**පිළිතුරු පත්‍රය**

**ලකුණු දීමේ පටිපාටිය 1. කොටස**

## 01.

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|
| 1.1 | 2 | 1.11 | 1 |
| 1.2 | 5 | 1.12 | 2 |
| 1.3 | 4 | 1.13 | 5 |
| 1.4 | 1 | 1.14 | 2 |
| 1.5 | 2 | 1.15 | 1 |
| 1.6 | 2 | 1.16 | 5 |
| 1.7 | 3 | 1.17 | 4 |
| 1.8 | 2 | 1.18 | 5 |
| 1.9 | 4 | 1.19 | 3 |
| 1.10 | 3 | 120 | 3 |

## 02. අ.

i. නුපුරුදු පරිසරයක්,නොදන්නා සංස්කෘතියෙත් වාසය කිරීමටත් සිදු වීම නිසා
ii. ආර්ථික මට්ටම
iii. ආරක්ෂාව සඳහා මුල් කාලයේ ඒකරාශී වීම සිදුවන අතර එම ප්‍රදේශයට හුරු වූ පසුව ස්වාධීනව කටයුතු කරනු ලැබීම.
iv. හිත මිතුරන් සිටීම,ඥාතීන් සිටීම, ජාතිකත්වය
v. ඇමරිකාවේ නිව්යෝර්ක් නගරයේ ඩසීනා ටවුන් හා ඉන්දියන් සිටී.
vi. සංක්‍රමණය වන්නාට නගරයේ හැඳුනුම්කමක් තිබීම සහ එකී හඳුනන පිරිස් සංක්‍රමණිකයන්ට පහසුකම් සැපයීම.

**ආ.** වචන 70 -80 අතර

නියමිත වචන ප්‍රමාණය - 02

භාෂා නිරවද්‍යතාවය - 03

අන්තර්ගතය - 08

**එකතුව - 13**

- නිරීක්ෂණාත්මක අධ්‍යයනය සමාජ ක්‍රමය පිළිබඳ ගුණාත්මක තොරතුරු ලබා ගන්නා ක්‍රමයකි.
- මෙහිදී පර්යේෂකයන් සමාජයට බලපෑමක් නොකරයි.
- විධිමත් නිරීක්ෂණ ක්‍රමය කිහිපාකාර වන්නේ විද්‍යාගාර නිරීක්ෂණය හා ස්වභාවික සමාජ වටපිටාවේ සිදුවන ලෙස හා සහභාගී නිරීක්ෂණ ක්‍රමය ලෙසයි.
- මේ ක්‍රම වලට ආවේණික ලක්ෂණ කිහිපයක් දැකිය හැකිය.

**03.** වචන සංඛ්‍යාව 300 – 350 අතර වේ නම් ඉහළ ලකුණු ප්‍රධානය කළ හැකිය. වචන 400ට වැඩි වේ නම් හෝ 250ට අඩුවේ නම් හෝ ලකුණු 03ක් අඩු කළ යුතු වේ.

වාක්‍ය රචනයට ලකුණු දීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම සුදුසුය.

i. රචනය සඳහා තෝරා ගත් මාතෘකාව යටතේ ප්‍රමාණවත් ලෙස කරුණු ඒකරාශීකරණය.
ii. එම කරුණු සංවිධානාත්මක ව ඉදිරිපත් කිරීම.
iii. කරුණුවල පැහැදිලි බව.
iv. නිරවද්‍ය අක්ෂර වින්‍යාසය අනුගමනය කර තිබීම.
v. ව්‍යාකරණ දෝෂ රහිත වීම.
vi. භාෂාව ව්‍යක්ත ලෙස හැසිරවීම.
vii. සුදුසු ලෙස පද බෙදීම් හා ඡේද වෙන් කිරීම.
viii. කියවිය හැකි සේ අත් අකුරු පැහැදිලි වීම.

- විවිධ භාෂාත්මක ප්‍රයෝග භාවිතය(මෙහිදී උපමා,රූපක,ආප්තෝපදේශ,ප්‍රස්ථාව පිරුළු, වැනි අංග ගැන සැළකිල්ල යොමු කරන්න. එහෙත් ඒ වෙනුවෙන් වෙන වෙනම ලකුණු දීම අනවශ්‍යය. සමස්තයක් වශයෙන් රචනාවෙහි මෙකී අංග සලකා ලකුණු ප්‍රධානය කළ හැකිය.

**04. අ.**

i. දායකයෝ දහම් මග යත් නම් ස්වාමීන් වහන්සේ එය අගයති.
ii. යුද්ධය නිම වූ පසු ලෝක වාසීහු සතුටින් දිවි ගෙවති.
iii. ඉන්දීය ක්‍රිකට් කණ්ඩායමේ නොහික්මුණු යොවුන් ක්‍රීඩකයෝ ඇත.
iv. ගොවීන් සමග ගෙවිලියෝ උද්ඝෝෂණයට ගිය හ.
v. සහ ගණ පිඬු සිඟා වඩිති.

**ආ.**

i. ලෝක නායකයන් විසින් සාම ගිවිසුමක් අත්සන් කෙරෙයි/කරනු ලබයි/කරනු ලැබෙයි.
ii. ගම් වැසියන් විසින් වන අලි පලවා හැරෙති/ හරිනු ලබති/ හරිනු ලැබෙති/ හරිනු ලබත්.
iii. අමාත්‍යවරයා විසින් නව ලේකම් වරයා සේවයෙන් ඉවත් කෙරිණි/ කරනු ලැබිණි/ කරන ලදී/ කරනු ලැබුවේය.
iv. ජනපති වරයා විසින් නිලධාරීන් ලවා ඩෙංගු මර්දන වැඩසටහනක් ක්‍රියාත්මක කරවනු ලබයි/ කරවනු ලැබෙයි
v. දෙවියන් විසින් තොපි ආරක්ෂා කෙරුනෙහු/කරනු ලැබුවෙහු/ කරන ලදහු.

**ඉ.**

i. සියොත්හු/ ගයති
ii. අප/ පිරිණි
iii. මා/ ගුරුවරියක්
iv. හෙවත්/ ලියුවේය
v. ශිෂ්‍යයෝ/ ගුරුවරුන් (3×5 = 15)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers • Model Answers • Study Resources

**5.**

| වචන | ව්‍යාකරණ අංශය | අනු අංකය |
| --- | --- | --- |
| දිගත<br>පතළ<br>සඳුන් කඳ | සන්ධි<br>කෘදන්ත<br>සමාස | පූර්ව ස්වර ලෝප සන්ධිය<br>අතීත කෘදන්ත/කර්තෘකාරක කෘදන්ත<br>විශේෂණ සමාස |
| පාසල්වල<br>ප්‍රමුඛතා<br>උදෙසා | විභක්ති<br>තද්ධිත<br>නිපාත | සම්බන්ධ විභක්ති<br>භාවාර්ථය<br>පිණිසාර්ථය |
| හිනැහෙමින්<br>පනිද්දී<br>නිහඬ | ක්‍රියා<br>ක්‍රියා<br>උපසර්ග | මිශ්‍ර ක්‍රියා/ මුසු කිරිය<br>කාලාර්ථය අසම්භාව්‍ය ක්‍රියා/ අසම්භාව්‍ය ක්‍රියා<br>විරුද්ධාර්ථය/ නිෂේධාර්ථය |
| මලගෙටියෙන්<br>පොවමින්<br>අතිනතින | විභක්ති<br>ක්‍රියා<br>සන්ධි | කරණ විභක්ති<br>මිශ්‍ර ක්‍රියා<br>ස්වර සන්ධිය |
| හෙළබස<br>පිණිස<br>කුමාරතුංගයෝ | සමාස<br>නිපාත<br>විභක්ති | සම්බන්ධ විභක්ති සමාස/ විභක්ති සමාස<br>පිණිසාර්ථය<br>ප්‍රථමා විභක්ති |

6. අ.

i. පතළ
ii. නිරවද්‍ය
iii. විදේශීය
iv. පතල
v. විදෙස්
vi. නිවැරදි (ලකුණු 2/1×6 = 03)

ආ.

i. ප්‍රබන්ධෝපාය
ii. පරීක්ෂණ
iii. සිතියම්
iv. බුත්සරණ
v. මුං පියළි
vii. නනරුත් (ලකුණු 2/1×6 = 03)

ඉ.

i. වනයෙහි - ආධාර , පරිසරය - කර්ම
ii. සොයුරනි - ආලපන , මව් රටට - සම්ප්‍රදාය
iii. උගතුන් විසින් - කර්තෘ , ප්‍රඥාව - ප්‍රථමා (ලකුණු 2/1×6 = 03)

ඊ.

i. විටෙක රළ පෙළ ඉපිලෙයි, සිනාසෙයි, සමුදුර කෙතරම් මනරම්ද?
ii. කොළඹ කොටුව - යාපනය දක්වා ධාවනය වන දුම්රිය පෙ.ව. 6.00 වේදිකාවට පැමිණෙයි.
iv. "මට බුදුන්ගේ සරණ ලැබේවා" යි බැතිමතා කීවේය. (ලකුණු 2/1×6 = 03)

උ.

i. දරුවන් අමතා පසු දින පාසලට නොඑන ලෙස / මෙන් ගුරුතුමා පැවසීය. ගුරුතුමා දරුවන් අමතා පසුදින පාසල් නොඑන ලෙස පැවසීය.
ii. තමන් රට වෙනුවෙන් තමන්ගේ ජීවිතය පරිත්‍යාග කරන බව නායකයෝ කීහ.
v. නිලධාරීන් ආයතනයෙන් පිටව යද්දී කම්කරුවන් කෑ ගසමින් සිටිය බව වාර්තාකරු පැවසීය. (ලකුණු 2/1×6 = 03)

7.

i. අංශයන්, අවස්ථාවන්,ආක්‍රමිකයන්ට, ප්‍රෞඪ, රජවරුන්,ලාංකිකයා, සාක්ෂි.
ii. ස -
තු - කෙටි පාපිල්ල
රු - කෙටි පාපිල්ල

අ -
භි - කෙටි ඉස්පිල්ල
යෝ - කොම්බුව සහ දීර්සත්ව සලකුණ සහිත ඇලපිල්ල
ග -
ය -
ක් -

සූ - දීර්ඝ පාපිල්ල
දා - ඇල පිල්ල
න -
ම -

iii. භූෂණාර්ථයේ - අභිමානවත්,අභියෝග,සුරක්ෂිත
විරුද්ධාර්ථයේ - අකම්පිත
iv. යුද්ධෝපක්‍රම - යුද්ධ + උපක්‍රම
අවස්ථානුකූල - අවස්ථා + අනුකූල
ක්‍රමෝපාය - ක්‍රම + උපාය
v. අවස්ථාවන් (ලකුණු 1×3 = 3)

8. මාතෘකාව හඳුන්වා දී විස්තර කිරීම සඳහා ලකුණු 02

උදාහරණ සඳහා ලකුණු 03

**සරසඳ ස්වර සන්ධිය (ස්වර සන්ධිය)**

'සර ලොප් නැත ද සර ගතට පැමිණ වූ බැවින් සර සඳ නම්' (සි.ස. 2.4)

අර්ථය : ස්වර ලෝපයක් නැතත්, ස්වරය, එනම් පරස්වරය, ගාත්‍රයට, එනම් පූර්ව ව්‍යංජනයට පැමිණ වූ / සම්බන්ධ කළ හෙයින් ස්වර සන්ධි නම් වෙයි.

උදා:- පසැස් - පස්+ ඇස් - → පසැස් බුදුන්ට නමකි

සහසැස් - සහස්+ ඇස් → සක්‍රයා

**විධි ක්‍රියා**

යම් විධානයක්, නියෝගයක් අණ කිරීම සඳහා යොදාගනු ලැබෙන ක්‍රියාව විධි ක්‍රියා යනුවෙන් හැඳින්වේ. විධානය ආදරයෙන් හෝ අනාදරයෙන් හෝ කරන්නක් විය හැකිය. තමා අභිමුඛයෙහි සිටින අයෙකු සඳහා පමණක් විධානයක් කළ හැකි බැවින් බොහෝ දුරට විධි ක්‍රියාව මධ්‍යම පුරුෂයෙහි පමණක් යෙදේ.

උදා:-

1. පුතේ මෙහි එන්න.
2. කරව පියාසර
3. වරෙව්,යමව්,නැගිටිව්/ අවධිවනු මැනවි

**භාව කාරක කෘදන්ත**

කර්තෘ හෝ කර්ම හෝ අර්ථයක් නොදී හුදු ක්‍රියා මාත්‍රයක් හෝ භාවයක් හඟවන පද භාව කාරක කෘදන්තයි. ධාතුවකට පරව,

නු, උම්, ඊම්, ඉලි, මන් යන ප්‍රත්‍ය ඒක්වීමෙන් මෙම කෘදන්ත පද යෙදෙයි.

උදා:- ලිය + නු - ලියනු, ලිය + උම් - ලියුම්, ලිය + ඊම්- ලිවීම්,

ලිය + ඉලි - ලියවිලි, ලිය + මන් - ලියමන්

**විශේෂණ සමාසය**

සමාස විධි පහකි.ඉන් එක් වර්ගයක් වන්නේ විශේෂන සමාසයයි.මෙය ද පස් වැදෑරුම් ය.

1) විශේෂණ පූර්ව පද සමාසය - සුදු මල, දිළිඳු ජනයා
2) විශේෂණ අපර පද සමාසය - සැරියුත් තෙර,විදුර පඬි
3) උපමා පූර්ව පද සමාසය - සඳ වත,ගල් හිත
4) උපමා උත්තර පද සමාසය - පා තඹර,නරසී
5) සංඛ්‍යා පූර්ව පද සමාසය - දෙලොව, පස් පව්

**නාම විශේෂණ**

**නාම පදයකට විස්තරයක් වශයෙන් යෙදෙන පදය නාම පද වේ.නාම නාම,සර්ව නාම,සමාස නාම,තද්ධිත නාමහා කෘදන්ත නාම වශයෙන් වර්ග වේ.නාම නාම ජාති නාම (රෝස මල),ද්‍රව්‍ය නාම (සෙල් පිළිම),ගුණ නාම(සුදු පත්තර),සංඥා නාම(රත්නපුරය) ලෙස ද දැක්විය හැකි යි.**

( 3×5=15)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources